සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙවන වාර පරීක්ෂණය 2019

10 ශ්‍රේණිය **කෘෂි හා ආහාර තාක්ෂණය - I** **කාලය පැය 03 යි.**

නම/ විභාග අංකය:

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. අතීතයේ ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික සශ්‍රිකත්වයක් පැවැති බවට බොහෝ සාක්ෂි ඇත. එම සාක්ෂි වලට උදාහරණයක් වන්නේ,
(1) දියුණු වාරිතාක්ෂණයක් තිබීම සහ සහල් අපනයනය කිරීමයි
(2) වැව් ප්‍රතිසංස්කරණය කිරීම සහ ණය සහනාධාර ලබා දීමයි
(3) බහු කාර්ය සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක වීම සහ එළවළු අපනයනය කිරීමයි
(4) පූර්ණ කාලීන රාජ්‍ය අනුග්‍රහය ලැබීම සහ පොහොර සහනාධාරය ක්‍රියාත්මක වීමයි

02. ශාක වල ප්‍රභාසංශ්ලේෂණය කෙරෙහි පරිසර උෂ්ණත්වයේ බලපෑම දැක්වෙන ප්‍රස්ථාරයක් මෙහි දැක්වේ. එමගින් පෙන්නුම් කරන්නේ,



(1) අඩු උෂ්ණත්වයේ දී ප්‍රභාසංශ්ලේෂණ වේගය වැඩි වන බවයි
(2) පරිසර උෂ්ණත්වය වැඩි වන විට ප්‍රභාසංශ්ලේෂණ වේගය ද වැඩි වන බවයි
(3) උෂ්ණත්වය සමඟ ප්‍රභාසංශලේෂණ වේගය ද යම් අගයක් තෙක් වැඩි වී උෂ්ණත්වය තව දුරටත් වැඩි වන විට ප්‍රභාසංශ්ලේෂණ වේගය අඩු වන බවය
(4) උෂ්ණත්වය වැඩිවන විට ප්‍රභාසංශ්ලේෂණ වේගය අඩුවන බවය

03. ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ප්‍රධාන ක්‍රම අතරින් වාසුලි වැසි වැඩි වශයෙන් ම ඇතිවන මාසය වන්නේ,
(1) පෙබරවාරි මාසය (2) ජූලි මාසය (3) ඔක්තෝබර් මාසය (4) දෙසැම්බර් මාසය

04. ආලෝක තීව්‍රතාවය සහ සුළඟේ වේගය මනිනු ලබන සම්මත ඒකක පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) මිලි ලීටර් සහ තත්පරයට මීටර් (2) ලක්ස් සහ පැයට කිලෝ මීටර්
(3) මිලි මීටර් සහ පැයට කිලෝමීටර් (4) පැයට කිලෝමීටර් සහ ලක්ස්

05. අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) පරිසරයේ ආර්ද්‍රතාවය වැඩිවන විට ශාක රෝග ආසාදන වැඩි වේ.
(2) උත්ස්වේදන වේගය වැඩි වීමෙන් ජලය හා ශාක පෝෂක අවශෝෂණය වැඩි වේ.
(3) තද සුළඟ බෝග වල පරාගනයට දායක වේ.
(4) නිල් හා රතු ආලෝකය ප්‍රභාසංශ්ලේෂණයට හිතකර වර්ණ වේ.

06. WU යන සංකේතයෙන් හඳුන්වනු ලබන කෘෂි දේශගුණික කලාපය වන්නේ,
(1) උඩරට තෙත් කලාපය (2) පහතරට වියළි කලාපය
(3) මැදරට අතරමැදි කලාපය (4) උඩරට අතරමැදි කලාපය

07. අන්තර්ජාතික පාංශු වර්ගීකරණයට අනුව 0.002 mm ට අඩු විශ්කම්භයක් සහිත ඛනිජ අංශු වන්නේ,
(1) රොන්මඩ (2) මැටි (3) සියුම් වැලි (4) බොරළු

08. විසිරි ඛාදනය අවම කිරීම සඳහා යොදාගත හැකි පාංශු සංරක්ෂණ ක්‍රමයක් වන්නේ,
   (1) හෙල්මළු ආකාරයට භූමිය සකස් කිරීම
   (2) දෙවැටි යෙදීම
   (3) පස ඉක්මනින් ආවරණය කරන බෝග වගා කිරීම
   (4) සමෝච්ඡ රේඛා අනුව වගා කිරීම
09. බෝග වගා කිරීමේ ප්‍රධාන මාධ්‍ය වන්නේ පසය. මෙහිදී පස මගින් ඉටු කෙරෙන සුවිශේෂී කාර්යයක් නොවනුයේ,
   (1) ශාක වල සංධාරක කෘත්‍ය ඉටු කිරීම
   (2) පාංශු ජීවීන්ට වාසස්ථානයක් සැපයීම
   (3) වර්ෂා ජලය අවශෝෂණය කර තබා ගෙන එය ශාකවලට ලබා දීම
   (4) කාබන් මූල ද්‍රව්‍ය ශාක වලට ලබා දීම
10. පසක පාංශු ජීවීන්ගේ වර්ධනයට යෝග්‍ය වන පරිදි සකසා ගැනීම සඳහා කළයුතු වන්නේ,
   (1) පස බුරුල් කිරීම හා රසායනික පොහොර යෙදීම
   (2) පස බුරුල් කිරීම හා කාබනික ද්‍රව්‍ය යෙදීම
   (3) පස පෙරළීම හා පසට රසායනික ද්‍රව්‍ය යෙදීම
   (4) පසට රසායනික පොහොර යෙදීම හා ජලය යෙදීම
11. බෝග වගා කිරීම සඳහා සුදුසු පසක තිබිය යුතු පාංශු ඛනිජ ප්‍රතිශතය,
   (1) 45% (2) 25% (3) 5% (4) 50%
12. රතු කහ පොඩ්සොලික් පස බහුලව දක්නට ලැබෙන ශ්‍රී ලංකාවේ තෙත් කළාපයට අයත් දිස්ත්‍රික්ක දෙකක් තෝරන්න.
   (1) අම්පාර, අනුරාධපුරය (2) කොළඹ, පොළොන්නරුව
   (3) ගාල්ල, මාතර (4) මහනුවර, හම්බන්තොට
13. පසක ස්ථිර මැලවීමේ අංකය සෙවීමට '' දර්ශක'' ශාකය ලෙස බොහෝ විද්‍යාඥයන් භාවිතා කරන්නේ කවර ශාක වර්ගයක් ද?
   (1) දහස්පෙතියා ශාකය (2) සූරියකාන්තා ශාකය (3) වැටකෙයා ශාකය (4) දියහබරල ශාකය
14. පැබේසියේ කුලයට අයත් බෝග කාණ්ඩය තෝරන්න.
   (1) බඩ ඉරිඟු, මෑ සහ උඳු (2) බටු, මිරිස්, තක්කාලි
   (3) කරවිල, වැටකොළු, මාළු මිරිස් (4) මෑ, බෝංචි, දඹල
15. ප්‍රයෝජන අනුව බෝග වර්ගීකරණය කිරීමේ දී කොළ පොහොර සඳහා වඩාත් සුදුසු බෝග වර්ගය අයත් කාණ්ඩය වන්නේ,
   (1) තේක්ක, මහෝගනී, නැදුන් (2) පියුරේරියා, ඩෙස්මෝඩියම්, සෙන්ට්‍රොසීමා
   (3) වල්සූරියකාන්ත, ග්ලිරිසීඩියා, අඬනහිරියා (4) හුලංතලා, කුඩමැට්ට, ගිරාපලා
16. පහත සඳහන් බෝගවර්ග අතරින් එකම කුලයට අයත් බෝග කාණ්ඩය විය හැක්කේ කුමක් ද?
   (1) බතල, කංකුං, මිරිස් (2) කැරට්, සූදුරු, ගොටුකොළ
   (3) පතෝල, ලබු, අර්ථාපල් (4) දෙහි, බෙලි, කජු
17. වගාවක් සඳහා බිම් සැකසීමේ දී සිදුකරන ක්‍රියාවලි කීපයක් පහත දැක්වේ.
   A පස පෙරළීම B පාත්ති සැකසීම
   C පස් කැට පොඩිකිරීම D වල් පැළෑටි යටවීම
   මින් ප්‍රාථමික බිම් සැකසීමට අයත් වන්නේ,
   (1) A හා D (2) A හා B (3) C හා B (4) A හා C
18. යන්ත්‍ර බලයෙන් ක්‍රියාත්මක වන ද්විතියික බිම් සැකසීමේ උපකරණයක් විය හැක්කේ,
   (1) හැඩ ලෑලි නගුල (2) තැටි නගුල (3) රොටවේටරය (4) රොටරි වීඩරය

19. බෝග සංස්ථාපනය කිරීමේ දී බීජ වප්කරය භාවිතා කිරීමෙන් වඩා පහසු වන්නේ,
   (1) කුඩා බීජ පේළි රහිතව වගා කිරීම පහසු කිරීම
   (2) රෝග හා පළිබෝධ හානි අවම වීම
   (3) ප්‍රරෝහණය පහසු වීම
   (4) බෝග සංස්ථාපනයට යන කාලය හා ශ්‍රමය අඩු වීම

20. තවාන් වලට බහුලව වැළදෙන දියමලං කෑම රෝගය පාලනය කිරීමට යොදා ගත හැකි ද්‍රව්‍යයක් වන්නේ,
   (1) කොහුබත් (2) කොම්පෝස්ට් (3) දහයියා අඟුරු (4) දහයියා

21. තවානක් සැකසීමේ දී අනුගමනය කරන පියවර කීපයක් පහත දැක්වේ.
   A තවාන ජීවානුහරණය කිරීම B තවාන් මිශ්‍රණය හා තවාන පිළියෙල කිරීම
   C සුදුසු ස්ථානයක් තේරීම D රෝපන ද්‍රව්‍ය සංස්ථාපනය

22. A, B, C, D (2) C, B, A, D (3) A, C, B, D (4) D, C, A, B

22. තවාන් පාත්තියක් පිළියෙල කර ගැනීමේ දී වගා කරුවකු විසින් වඩාත් සැලකිලිමත් විය යුත්තේ පාත්තියේ,
   (1) දිග පිළිබඳවය (2) පාත්තියේ මට්ටම පිළිබඳවය
   (3) උස පිළිබඳවය (4) පළල පිළිබඳවය

23. වගා භූමිවල ඇති අතිරික්ත ජලය හෙවත් පසේ ක්ෂේත්‍රධාරිතාවෙන් ඔබ්බට ඇති ජලය ක්ෂේත්‍රයෙන් බැහැර කිරීම හඳුන්වනු ලබන්නේ,
   (1) ජල වහනය ලෙසය (2) ජල සම්පාදනය ලෙසය
   (3) ජල සංරක්ෂණය ලෙසය (4) ජල කළමණාකරනය ලෙසය

24. ඉසින ජල සම්පාදන ක්‍රමයේ වාසියක් වනුයේ,
   (1) උසින් වැඩි ශාක වලට ද භාවිතා කළ හැකි ය
   (2) අඩු මුදලකින් සකසාගත හැකිය
   (3) බෝගයේ මූල මණ්ඩලයට මෙන්ම පත්‍ර වලට ද ජලය ලැබීම ය
   (4) අධික සුළං සහිත ප්‍රදේශ වලට ද යොදා ගත හැකි වීම ය

25. පසක ඇති අතිරික්ත ජලය පස මතුපිටින් ඉවතට ගලායාම හඳුන්වනු ලබන්නේ,
   (1) වැස්සීමය (2) වාෂ්පීකරණය වීමයි
   (3) පෘෂ්ඨීක ආපදාවය යි (4) ජල වහනය යි

26. ඒකාබද්ධ ශාකපෝෂක කළමනාකරණය අනුගමනය කරමින් පොහොර යෙදීමේ දී
   (1) කාබනික පොහොර පමණක් භාවිතා කරයි
   (2) රසායනික පොහොර, කාබනික පොහොර සමග මිශ්‍රව භාවිතා කරයි
   (3) රසායනික පොහොර පමණක් භාවිතා කරයි
   (4) කාබනික දියර පොහොර පමණක් භාවිතා කරයි

27. ශාක පෝෂණයේ දී වායුගෝලයෙන් ලබා ගන්නා මූල ද්‍රව්‍යයන් වන්නේ,
   (1) C හා O ය (2) C හා H ය (3) O හා N ය (4) H හා P ය

28. ශාක වල මූල පද්ධතියේ වර්ධනයට වැදගත් වන මූල ද්‍රව්‍ය වනුයේ,
   (1) N (2) P (3) K (4) Mg

29. නියමිත පරතරයක් රහිත සහ අඩු පරතරයක් ඇතිව සිටුවා ඇති බෝග සඳහා සුදුසු පොහොර යෙදීමේ ක්‍රමයක් වන්නේ,
   (1) පැළ අවට යෙදීම
   (2) පේළියට යෙදීම
   (3) වගාබිමේ වලවල් සකස් කර ඒවා තුළට පොහොර යෙදීම
   (4) පොහොර ඉසීම

30. අර්ධ පොහොර මිශ්‍රණයක් වන බණ්ඩි පොහොර වල අඩංගු ප්‍රධාන මූල ද්‍රව්‍ය දෙක මොනවාද?
   (1) N හා P (2) N හා S (3) N හා K (4) P හා K

31. ශාක වලට හානි කරනු ලබන කෘමි පළිබෝධකයින් කිහිපයක් පහත වගුවේ දැක්වේ. ඒවායින් නිවැරදි ගැළපීම තෝරන්න.

	පළිබෝධක කෘමියා	හානි කරන බෝග අඩංගු කුලය	හානි කරන අවධි
1.	අවුලක පෝරා	කුකර් බිටේසියේ	සුහුඹුලා, කීටයා
2.	ඉල්මැස්සා	මැල්වේසියේ	සුහුඹුලා, කීටයා
3.	කීඩෑවා	පැබේසියේ	ශිශුවා, සුහුඹුලා
4.	රයිනෝසිරස්	කුකර්බිටේසියේ	කීටයා

32. ස්පර්ශ වූ ස්ථානය තුළින් වල් නාශකය වල් පැළෑටිය තුළට ඇතුළු වීමෙන් මුළු ශාකයම විනාශ වන්නේ,

(1) ස්පර්ශ, තෝරා නසන වල් නාශක මගිනි (2) ස්පර්ශ සියල්ල නසන වල් නාශක මගිනි

(3) සංස්ථානික වල් පැළෑටි නාශක මගිනි (4) ස්පර්ශ වල් පැළෑටි නාශක මගිනි

33. රූපයේ පෙන්වා ඇති රෝග ලක්‍ෂණය හටගන්නේ කවර රෝගකාරකයා ගෙන් ද?

(1) බැක්ටීරියා

(2) වටපණු

(3) වයිරස්

(4) දිලීර

34. මීමැසි ගෝචර ශාකයක් ලෙස අපරටට ගෙන්වන ලද එක්තරා ශාකයක් ආක්‍රමණශීලී වල් පැළෑටියක් ලෙස සලකනු ලැබේ. එය කවරක් ද?

(1) ගඳපාන (2) පාතිනියම් (3) යෝධ නිදිකුම්බා (4) විඩේලියා

35. වගා ක්ෂේත්‍රයක තිබූ කෙසෙල් ගසක පහත රූපීය ලක්ෂණ පෙන්නුම් කරන ලදි.

- ★ පත්‍ර ගොනු ගැසී, පත්‍ර සෙව්වන්දියක් සේ පිහිටීම
- ★ පත්‍ර නටු කෙටිවීම
- ★ අළුත් පත්‍ර කහවන් කොළ පැහැයක් ගැනීම

ඉහත ලක්‍ෂණ අනුව මෙම ශාකයට වැළඳී ඇති රෝගය වන්නේ,

(1) වඳ පීදීම (2) පත්‍ර විචිත්‍රය (3) මුල් ගැට රෝගය (4) හිටුමැරීම

36. බෝගවගාවේ දී මර්ධනයට අපහසු වල් පැළෑටි යුගලයක් තෝරන්න.

(1) තුනැස්ස, තුන්හිරියා (2) වෙල්මාරුක්, ගිරාපලා

(3) කළාඳුරු, ඇටවරා (4) මොනරකුඩුම්බිය, පොල්පලා

37. අර්ධරූපාන්තරණය පෙන්වන පළිබෝධකයකු වනුයේ,

(1) පළතුරු මැස්සා (2) ගොයම් මැස්සා (3) දෙහි සමනලයා (4) අවුලක පෝරා

38. බතලගොඩ වී අභිජනන මධ්‍යස්ථානය මගින් නිපදවන ලද වී ප්‍රභේදයක් නොවන්නේ,

(1) Bg 300 (2) Bw 351 (3) Bg 450 (4) Bg 3-5

39. මාස 4 වී ප්‍රභේදයක වර්ධක අවධි කාලයට අයත්වන දින ගණන,

(1) දින 30 (2) දින 45 (3) දින 60 (4) දින 65

40. ඉපියා, ගොඩවෙල්ලා, කීඩෑවා යන පළිබෝධකයින් ගෙන් සිදුවන හානිය පිළිවෙලින් දක්වෙන්නේ,

(1) කිරිවදින බීජ වල යුෂ උරාබීම, පත්‍ර ආහාරයට ගැනීම, නියරේ ගුල් හෑරීම

(2) පත්‍රවල යුෂ උරාබීම, ගබඩා බීජ වලට හානි කිරීම, පත්‍ර රෝල් කිරීම

(3) වර්ධක කොටස් ආහාරයට ගැනීම, යුෂ උරා බීම, අභ්‍යන්තර කුහර සෑදීම

(4) ගබඩා බීජ වලට හානි කිරීම, ශාකයේ බාහිර කොටස් ආහාරයට ගැනීම, වර්ධක කොටස් වලින් යුෂ උරාබීම

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙවන වාර පරීක්ෂණය 2019

10 ශ්‍රේණිය **කෘෂි හා ආහාර තාක්ෂණය - II**

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

01. වාර්ෂික වර්ෂාපතනය 1750 mm ට අඩු දේශගුණික කලාපයක පිහිටා ඇති පාසලක සිසුන් පිරිසක් තම පාසල් ගෙවත්තේ බිම් කොටසක් තෝරාගෙන ඉන් එක් කොටසක ක්ෂේත්‍ර බෝග ද, ඉතිරි කොටසෙහි වී වගාව ද කිරීමට තීරණය කරන ලදී.
   i. මෙම වගා බිමෙහි වගා කිරීමට සුදුසු කුකර්බිටේසියේ කුලයේ බෝග වර්ග දෙකක් නම් කරන්න.
   ii. (a) මෙම ප්‍රදේශයට ප්‍රධාන වශයෙන් වර්ෂාව ලැබෙන මෝසම් ක්‍රමය කුමක් ද?
   (b) එම වර්ෂාව ලැබෙන කාල සීමාව දක්වන්න.
   iii. ඔබ හඳුනාගත් පරිදි මෙම කලාපයේ බහුලව දැකිය හැකි පස් කාණ්ඩය කුමක් විය හැකි ද?
   iv. ස්විස් හෝව, කෝනෝ විඩරය යන උපකරණ බිම් සැකසීමේ කවර අවස්ථාවක දී යොදා ගනීද?
   v. වී, තල, කුරක්කන් වැනි බෝග සංස්ථාපනය කිරීමේ දී වැපිරීම සිදු කරනු ලබයි. එම වැපිරීම සිදු කරන ක්‍රම 02 නම් කරන්න.
   vi. රනිල බෝග බණ්ඩක්කා වැනි බෝග වල පැළ උදුරා නැවත සිටුවීම සිදු නොකරයි. එයට හේතුව කුමක් ද?
   vii. වී වගාවට ජලය සැපයීමට බහුලව භාවිත කරන ජලසම්පාදන ක්‍රමය ලියන්න.
   viii. යම් ශාකයක පත්‍ර දාර කහපාට වීම පත්‍ර දාර පිළිස්සුණු ස්වභාවයක් ගැනීම යන ලක්ෂණ පෙන්වයි නම් එය කවර පෝෂකය ඌනතාවයෙන් දැයි ලියන්න.
   ix. පිපිඤ්ඤා පත්‍ර විචිත්‍ර රෝගය ඇති කරන වෛරසයේ ධාරකයෙකු ලෙස ක්‍රියාකරන වල් පැළෑටිය නම් කරන්න.
   x. වී වගාවේ දී කුඩීර වලට මඩ පුරවා තැටි තවාන මත 10 - 12 cm උසට වැඩුණු පැළ පොකුරු වශයෙන් ලියද්දේ ඉහළට විසි කිරීමෙන් ක්ෂේත්‍රයේ සංස්ථාපනය කරන ක්‍රමය නම් කරන්න.

02. බෝග වගාවේදී වායව පරිසර සාධක අවශ්‍ය පරිදි වෙනස් කිරීම අපහසු කාර්යයක් වන අතර පාංශු පරිසර සාධක බෝගයට අවශ්‍ය පරිදි කළමනාකරණය කරගත හැකිය.
   i. a. විෂ්කම්භය අනුව පාංශු ඛනිජ ආකාර 03 නම් කරන්න.
   b. පාංශු වාතයේ ඇති ඔක්සිජන් වායුවේ අවශ්‍යතාවයන් දෙකක් සඳහන් කරන්න.
   ii.



   a. මෙහි දක්වෙන්නේ පාංශු ජලය පිළිබඳ නිරීක්ෂණ ලබා ගැනීමට යොදා ගත හැකි ඇටවුමකි. මෙයින් ඔබ ලබා ගන්නා නිරීක්ෂණය සඳහන් කරන්න.
   b. සංතෘප්ත අවස්ථාවේ පවතින පසක් ශාක වලට හිතකර නොවීමට හේතුව කුමක් ද?
   iii. a. පාංශු පුනරුත්ථාපනයේ දී අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු දෙකක් ලියන්න.
   b. පාංශු කැටායන හුවමාරු ධාරිතාවයේ වැදගත්කම් තුනක් ලියන්න.

03. බෝග වගා කිරීමේ දී මතු වන ප්‍රධාන ගැටළුව වන්නේ පළිබෝධ පාලනය කිරීමයි. එම පළිබෝධ හඳුනාගෙන ක්‍රියා කිරීමෙන් අපේක්ෂිත බෝග අස්වනු ලබා ගත හැකිය.
   i. a. ප්‍රධාන පළිබෝධ කාණ්ඩ නම් කරන්න.
   b. වගා නොකළ බිමක වල් පැළෑටි තිබීමෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න.
   ii. රූපකාරය අනුව වල් පැළෑටි ආකාර තුනකි. පහත දී ඇති වල්පැළෑටි භාවිතා කර වගුව සම්පූර්ණ කරන්න.

ඇටවරා, කළාඳුරු, තුන්හිරියා, තුනැස්ස, බටදැල්ල, බලුනකුට, වෙල්මාරුක්, දිය සියඹලා

තෘණ වර්ග	පන් වර්ග	පළල් පත්‍ර
....	....	....
....	....	....

iii. a. ශාක රෝගයක් යනු කුමක් ද?
b. ශාකයකට රෝගයක් වැළඳීම සඳහා සම්පූර්ණ විය යුතු කරුණු තුන සඳහන් කරන්න.

04. ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරය වූ බත සපයන්නේ වී ශාකයෙනි.
i. a. වී වගාව ශ්‍රී ලංකාවට වැදගත් වන ආකාර දෙකක් ලියන්න.
b. ශ්‍රී ලංකාවේ පාරම්පරික වී ප්‍රභේද තුනක් නම් කරන්න.
ii. a. පාරම්පරික වී ප්‍රභේදයක හා වැඩි දියුණු කළ වී ප්‍රභේදයක ලක්ෂණ දෙක බැගින් ලියන්න.
b. වී වගාවේ දී සකසනු ලබන තවාන් වර්ග තුනකි. ඒ මොනවාද?
iii. බිත්තර වී වල තිබිය යුතු ප්‍රමිති තුනක් සඳහන් කරන්න.

05. 10 ශ්‍රේණියේ සිසුන් කෘෂි කාලගුණික මධ්‍යස්ථානයක් නැරඹීමට ක්ෂේත්‍ර චාරිකාවකට සහභාගි වූහ. එහි කාලගුණික පරාමිතීන් මැනීමට යොදා ගන්නා විවිධ උපකරණ දැක ගැනීමට ඔවුනට අවස්ථාව ලැබුණි.
i. a. එහි උෂ්ණත්වමාන සවිකර තිබූ උපකරණයක් දක්නට ලැබුණි. එය නම් කරන්න.
b. ආර්ද්‍රතාවය, සුළඟේ වේගය, සුළඟේ දිශාව මැනීමට භාවිතා කරන උපකරණ පිළිවෙලින් නම් කරන්න.
ii. a. දිවයිනේ නිරිත දෙසින් ඇතුළු වී නිරිත දිග ප්‍රදේශය හා කඳුකරයේ බටහිර බෑවුමට වැසි ලබා දී නැගෙනහිර හා උතුරු මැද හරහා වියළි උණුසුම් සුළඟක් ලෙස හමා යන මෝසම් සුළං වර්ගය කුමක් ද?
b. පහත ඉංග්‍රීසි අක්ෂර වලින් දැක්වෙන කෘෂි පාරිසරික කලාප නම් කරන්න.
WL, DL, IM
iii. a. අතීතයේ කෘෂිකර්මයේ ස්වයංපෝෂිත බව ළඟා කර ගැනීමට දායකත්වය දැක් වූ අංශ තුන නම් කරන්න.
b. වර්ෂාපතන රටාව අනුව වී වගා කිරීමේ දී යල කන්නයට බිම් සැකසීමේ මාස මොනවාද?

06. ශාක වල යහපැවැත්ම සඳහා අවශ්‍ය පෝෂක අවට පරිසරයෙන් සහ වායු ගෝලයෙන් ලබා ගනී.
i. අත්‍යවශ්‍යය පෝෂක සංඝටක කීය ද?
ii. පහත දැක්වෙන භෞතික ලක්ෂණ අනුව මෙම පොහොර වර්ග හඳුනා ගෙන නම් කරන්න.
a. ජලයේ දියවන, සුදුපාට ගෝලාකාර ස්ඵටික
b. ජලයේ දියවන ගඩොල් රතුපාට සියුම් ස්ඵටික රූපී කැට
c. ජලයේ දියනොවන අළුපාට ගෝලාකාර කැට
iii. ගොවිපොළේදීම කාබනික ද්‍රව්‍ය ඇසුරෙන්
a. නිපදවා ගත හැකි දියර පොහොර වර්ග තුනක් ලියන්න.
b. පසට පොහොර යෙදීමේ ක්‍රම තුනක් සඳහන් කරන්න.

07. කෘෂිකාර්මික කටයුතු වල දී බෝග, කුල, ගණ හා විශේෂ ලෙස බෙදා දක්වා ඇත. මෙය විද්‍යාත්මක වර්ගීකරණයයි.
i. a. ඉඟුරු, කහ අයත් වන ශාක කුලය නම් කරන්න.
b. බෝග වර්ගීකරණයේ වැදගත්කම් දෙකක් ලියන්න.
ii. a. බීජ ප්‍රතිකාර කිරීමේ වැදගත්කම් දෙකක් ලියන්න.
b. "පැළ දැඩි කිරීම" යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
iii. a. පෘෂ්ඨීක ජල සම්පාදන ක්‍රමයක් නම් කරන්න.
b. ඉසින ජල සම්පාදනයේ අවාසි දෙකක් දක්වන්න.

පිළිතුරු පත්‍රය - I කොටස

1 -(1)	2 -(3)	3 -(4)	4 -(2)	5 -(3)	6 -(1)	7 -(2)	8 -(3)	9 -(4)	10 -(2)
11-(1)	12 -(3)	13 -(2)	14 -(4)	15 -(3)	16 -(2)	17 -(1)	18 -(3)	19 -(4)	20 -(3)
21-(2)	22 -(4)	23 -(1)	24 -(3)	25 -(3)	26 -(2)	27 -(1)	28 -(2)	29 -(4)	30 -(3)
31-(1)	32 -(3)	33 -(2)	34 -(4)	35 -(1)	36 -(3)	37 -(2)	38 -(2)	39 -(3)	40 -(4)

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින් ල. 40යි.)

II කොටස

01. i. කරවිල, වැටකොළු, පතෝල, කැකිරි, වට්ටක්කා, පිපිඤ්ඤා, ලබු, පුහුල්
ii. a. ඊසාන දිග මෝසම
b. දෙසැම්බර්, ජනවාරි, පෙබරවාරි මාස
iii. රතු දුඹුරු පස
iv. අතුරු යත් ගෑම
v. අහඹු ලෙස වැපිරීම, පේළියට වැපිරීම
vi. උදුරා නැවත සිටුවීමේ දී ලක්වන පීඩාවට පැළ ඔරොත්තු නොදීම
vii. පිටාර ක්‍රමය
viii. K (පොටෑසියම්)
ix. හුළංතලා
x. පැරශුට් ක්‍රමය (ලකුණු 02 බැගින් 10 = මුළු ලකුණු 20)

02. i. a. වැලි, මැටි, රොන්මඩ (ල.01½)
b. බීජ පුරෝහණයට, ශාක මූල මණ්ඩලයේ ශ්වසනයට (ල.02)
ii. a. කේශාකර්ෂණ බලය නිසා ජලය ඉහළට ඇදෙන අයුරු නිරීක්ෂණය කළ හැක. (ල. 02)
b. සංතෘප්ත පසක වාතය නොමැති බැවින් ශාක මුල් වලට ශ්වසනය කළ නොහැකි වීම නිසා (ල. 01)
iii. a.
- පාංශු ඛාදනය අවම කිරීම
- පසෙහි හීන වූ භෞතික, රසායනික හා ජෛව ලක්ෂණ වගාවට හිතකර පරිදි සංවර්ධනය කිරීම (ල.02)

b. පොහොර ලෙස පසට යොදන පෝෂක රඳවා තබා ගනියි. අවශ්‍ය වූ විට පාංශු ද්‍රාවණයට අයන මුදා හැරීම පස සාරවත් වීම. (ල.01½)

03. i. a. වල් පැළෑටි, රෝග, කෘමි හා කෘමි නොවන සතුන් (ල.01½)
b. පාංශු ඛාදනය වැළැක්වීම, පාංශු ජලය වාෂ්පීකරණයෙන් ආරක්ෂා වීම, ගොවිපල සතුන්ට ආහාර ලැබීම, ඖෂධ වශයෙන් ප්‍රයෝජනවත් වීම, පසේ නයිට්‍රජන් තිර කිරීම වැනි සුදුසු පිළිතුරු සඳහා (ල.½x4 = 02)
ii. a.

තෘණ වර්ග	පළල් පත්‍ර	පන් වර්ග
බට දැල්ල ඇටවරා	බලු නකුට	කළාඳුරු
වෙල්මාරුක්	දියසියඹලා	තුනැස්ස, තුන්හිරියා

(ල.½x6=03)

iii. a. රෝග කාරකයාට හිතකර පරිසරය, රෝග කාරකයා, ධාරක ශාකය (ල.01½)
b. ශාකයට පීඩාකාරී වන අසාමාන්‍ය කායික ක්‍රියාදාමයකි. (ල. 02)

04. i. a. ප්‍රධාන ආහාරය වීම, ආහාර සුරක්ෂිතබව ඇති කිරීම, ජනතාවගෙන් වැඩි කොටසක් වී ගොවිතැනේ නිරත වීම, පෝෂණ අගය වැඩිවීම වැනි පිළිතුරු සඳහා (ල.02)
b. කුරුළු තුඩ, සුවඳැල්, මඩතවාළු, කළු හීනටි රත්දැල් වැනි වී වර්ග (ල.½x3 = 1½)

ii. a. පාරම්පරික වී ප්‍රභේද
ඇද වැටේ. පඳුරු දැමීම අඩුය පළිබෝධ හානි අඩුය. අස්වනු අඩුය. (ල.½x4=02)
වැඩි දියුණු කළ වී ප්‍රභේද - ශාකය මිටිය, ඇද වැටීමට ඔරොත්තු දේ. පඳුරු දැමීම වැඩිය. පළිබෝධ හානි වැඩිය, අස්වනු වැඩිය යනාදී ගැළපෙන පිළිතුරු 02 ක්

b. මඩ තවාන, තැටි තවාන, ඩැපොග් තවාන (ල.½x3=1½)

iii. ප්‍රරෝහණ ශක්තිය 85%
තෙතමනය 13%
වී 500g ක නියැදියක තිබිය යුතු වෙනත් බීජ 100
පවිත්‍රතාව 98% (ල.1x3=03)

05. i. a. ස්ටීවන්සන් ආවරණය (ල. 01)
b. ආර්ද්‍රතාමානය / අනිලමානය / සුළං දිශා දර්ශකය (ල.½x3=1½)
ii. a. නිරිත දිග මෝසම (ල. 01)
b. WL - පහතරට තෙත් කලාපය
DL - පහතරට වියළි කලාපය
IM - මැදරට අතරමැදි කලාපය (ල.1x3=03)
iii. a. රාජ්‍ය අනුග්‍රහය, වාරි තාක්‍ෂණය, ගොවිතැන හා බැඳුණු සංස්කෘතිය (ල.½x3=1½)
b. මාර්තු, අප්‍රේල් මාස (ල.02)

06. i. 16 කි. (මහා පෝෂක 9 / ක්‍ෂුද්‍ර පෝෂක 7) (ල. 01)
ii. a. යූරියා
b. මියුරේට් ඔෆ් පොටෑෂ්
c. සාන්ද්‍ර සුපර් පොස්පේට් (ල.1x3=03)
iii. a. කොළ පොහොර සහ කුකුළු පොහොර නිස්සාරකය, මත්ස්‍ය තෛලෝදය, ගැඩවිල් පණු දියරය (ල.1x3=03)
b. ඉසීම, පැළ අවට යෙදීම, පේළියට යෙදීම, වළවල් හාරා යෙදීම. (ල.1x3=03)

07. i. a. සිංජිබරේසියේ (ල. 01)
b. බිම් සැකසීමේ දී, පොහොර යෙදීමේ දී, බද්ධ කිරීම සඳහා ශාක තෝරා ගැනීමේ දී, රසායනික වල් නාශක භාවිතයේදී, පළිබෝධ පාලනයේදී (ල. 02)
ii. a. බීජ වලට සිදුවන පළිබෝධ හානි අවම කිරීම, බීජ වල ප්‍රරෝහණ ප්‍රතිශතය වැඩි කිරීම. (ල.02)
b. තවානේ ඇති පැළ ස්ථිර භූමියේ සිටුවීමට සුදුසු තත්වයට පත් කිරීමයි. (ල. 02)
iii. a. පිටාර, තීරු, බේසම්, ඇලි හා වැටි (ල. 01)
b. මූලික වියදම වැඩිය, තාක්‍ෂණික දැනුම අවශ්‍ය වේ. උසින් වැඩි බෝග සඳහා සුදුසු නැත. නළ යොදා ඇති නිසා අතුරු යත් ගෑම අපහසුය. වැනි සුදුසු පිළිතුරු දෙකක් සඳහා. (ල.1x2=02)